අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education, Sri Lanka

61 | S | I, II

අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை- ஆதரவு கருத்தரங்கு தொடர்- 2022 (2023)
G. C. E. Ordinary Level Examination - Support Seminar Series - 2022 (2023)

| | | |
|---|---|---|
| භූගෝල විද්‍යාව | I, II | පැය තුනයි. |
| புவியியல் | I, II | மூன்று மணித்தியாலம் |
| Geography | I, II | Three Hours |

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time – 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

## භූගෝල විද්‍යාව I

**සැලකිය යුතුයි:**

* මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න **40**කින් සමන්විත ය.

* එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූල ව **සියලු ම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.

- **අංක 1 සිට 5 දක්වා ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

1. පෘථිවිය මතුපිට වර්ග ප්‍රමාණය වර්ග කිලෝමීටර් මිලියන ....................................... ක් පමණ වේ. (150 / 510 / 610)
2. නිවර්තන දේශගුණික කලාපයේ සාමාන්‍යය උෂ්ණත්වය සෙල්සියස් අංශක .................................... කට වැඩි ය. (18 / 27 / 32)
3. ශ්‍රී ලංකාවේ වැඩි ම වී වගා බිම් ප්‍රමාණයක ව්‍යාප්තව ඇත්තේ ....................................... දිස්ත්‍රික්කයේ ය. (අනුරාධපුරය / අම්පාර / කුරුණෑගල)
4. ශ්‍රී ලංකාවේ ජල විදුලිබල පරිභෝජනයෙන් වැඩි ප්‍රතිශතයක් ....................................... සඳහා යොදා ගනී. (ගෘහස්ථ කටයුතු / කර්මාන්ත / වාණිජ කටයුතු)
5. 1992 රියෝ ද ජැනෙයිරෝ නුවර දී ....................................... සමුළුව පැවැත්වුණි. (නොබැඳි / මිහිකත / ස්ටොක්හෝම් )

- **අංක 6 සිට 10 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් 'නි' යන්න වටා ද, වැරදි නම් 'වැ' යන්න වටා ද රවුමක් අඳින්න.**

6. ශ්‍රී ලංකාව කුඩා දිවයිනක් වුව ද ගංගා නිම්න 133 ක් දක්නට ලැබේ. නි / වැ
7. මිද්දෙනිය ශ්‍රී ලංකාවේ සුළු පොල් ත්‍රිකෝණයට අයත් ප්‍රදේශයකි. නි / වැ
8. ශ්‍රී ලංකාවේ නිපදවන බෝට්ටු මාලදිවයින, සිංගප්පූරුව, ඉන්දියාව යන රටවලට ද අපනයනය කෙරේ. නි / වැ
9. ජාල උතුර සහ සැබෑ උතුර අතර $5^0$ ක කෝණික පරතරයක් ඇත. නි / වැ
10. වර්තමානයේ දී ඉන්ධන අරපිරිමැස්ම සඳහා දෙමුහුන් වාහන භාවිතය සුදුසු ය. නි / වැ

- **අංක 11 සිට 19 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.**

11. තස්මේනියා දූපත ........................................... මහාද්වීපයට අයත් වේ.
12. ශ්‍රී ලංකාවේ තේ වගාව........................................... වතුයායේ දී ආරම්භ කරන ලදි.
13. ශ්‍රී ලංකාවේ සමස්ත ජලවහනය ........................................... රටාවකින් යුක්ත ය.
14. කෘමිනාශක, ඖෂධ වර්ග, රසායනික පොහොර ආදිය ........................................... කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන වේ.
15. ලොව සක්‍රීය ගිනිකඳු වැඩි ප්‍රතිශතයක් දක්නට ලැබෙන්නේ ........................................... කලාපයේ ය.

- **අංක 16 සිට 19 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දී ඇති ප්‍රස්තාර සටහන උපයෝගී කරගන්න.**




16. සේවා කටයුතුවල වැඩි ම වර්ධන වේගයක් පෙන්වන්නේ .................................................... අංශයේ ය.
17. සේවා කටයුතුවල අඩු ම වර්ධන වේගයක් පෙන්වන්නේ .................................................... අංශයේ ය.
18. වැඩි ම හා අඩු ම වර්ධන වේගයක් පෙන්වන අංශ අතර වර්ධන වේගයේ වෙනස ........................................... කි.
19. මෙම ප්‍රස්තාර වර්ගය හඳුන්වන්නේ .................................................... ප්‍රස්තාර නමින් ය.

- **අංක 20 සිට 24 තෙක් දී ඇති ප්‍රශ්නවල 'අ' සහ 'ආ' යනුවෙන් තීරු දෙකක් දැක්වේ. 'අ' තීරුවේ ඇති තොරතුරුවල අනුපිළිවෙළට අනුව 'ආ' තීරුවේ ඇති තොරතුරු ගැළපූ විට නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන පිළිතුරට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.**

20.

| 'අ' | 'ආ' |
|---|---|
| **දිස්ත්‍රික්කය** | **වී වගා කරන කලාපය** |
| 1. මඩකලපුව, හම්බන්තොට | A. තෙත් කලාපය |
| 2. කළුතර, රත්නපුරය | B. අතරමැදි කලාපය |
| 3. බදුල්ල, මොණරාගල | C. කඳුකර බිම් |
| | D. වියළි කලාපය |

(1) ABC (2) BCD (3) CBD (4) DAB (…….)

21.

| 'අ' | 'ආ' |
|---|---|
| 1. වී | A. කළුතර |
| 2. පොල් | B. කුරුණෑගල |
| 3. රබර් | C. හලාවත |
| | D. කෑගල්ල |

(1) ABD (2) BAD (3) BCA (4) DCD (…….)

22.

| 'අ' | 'ආ' |
|---|---|
| රට | **යකඩ හා වානේ නිෂ්පාදන මධ්‍යස්ථාන** |
| 1. චීනය | A. දකුණු මැන්චූරියාව |
| 2. ජපානය | B. බර්මිංහැම් |
| 3. එක්සත් රාජධානිය | C. නගෝයා |
| | D. පීටර්ස්බර්ග් |

(1) ACB (2) BDC (3) CDA (4) DBC (…….)

23.

| 'අ' | 'ආ' |
|---|---|
| **ගංගාව** | **මහද්වීපය** |
| 1. මරේඩාලිං | A. යුරෝපය |
| 2. මිසිසිපි | B. ඕස්ට්‍රේලියාව |
| 3. නයිජර් | C. උතුරු ඇමෙරිකාව |
| | D. අප්‍රිකාව |

(1) ABD (2) BCD (3) CAB (4) DCB (…….)

24.

| 'අ' | 'ආ' |
|---|---|
| ආපදාව | බහුල ප්‍රදේශ |
| 1. නියඟ | A. උතුරු අත්ලන්තික් සාගරය |
| 2. සුළි සුළං | B. පැසිපික් සාගරික කලාපය |
| 3. ලැව්ගිනි | C. මධ්‍යම අප්‍රිකානු සහෙල් කලාපය |
| | D. ඉන්දුනීසියාව |

(1) ADB (2) BAC (3) CAD (4) DAC (…….)

- **අංක 25 සිට 37 දක්වා ඇති එක් එක් ප්‍රශ්නනයට දී ඇති පිළිතුරු හතර අතුරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ඊට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.**

25. ජන සංඛ්‍යාවේ ව්‍යුහාත්මක ලක්ෂණ දෙකක් ඇතුළත් වන පිළිතුර කුමක් ද ?
(1) වර්ධනය, ව්‍යාප්තිය (2) පුම්තිරි බව, භාෂාව
(3) පුම්තිරි බව, වයස් ව්‍යුහය (4) වයස් ව්‍යුහය, භාෂාව (…….)

26. නියඟ ආපදා තත්ත්වයක දී ඇතිවිය හැකි බලපෑමක් වන්නේ,
(1) පස හා ජල මූලාශ්‍රවලට බලපෑම් ඇතිවීම
(2) කෘෂි බිම් විනාශ වීම
(3) පොළොව ගිලා බැසීම
(4) බෑවුම් ප්‍රදේශවල ශාක ක්ෂණික ව මැරී යාම (…….)

27. මැදරට තේ වගා කරන ප්‍රදේශයක් වන්නේ,
(1) නුවරඑළිය (2) මාතර (3) රත්නපුරය (4) බදුල්ල (…….)

28. වෙරළේ සිට නාවික සැතපුම් 200 දක්වා වන මුහුදු ප්‍රදේශය හඳුන්වනු ලබන්නේ,
(1) අනන්‍ය ආර්ථික කලාපය (2) රාෂ්ට්‍රීය මුහුදු සීමාව
(3) යාබද මුහුදු කලාපය (4) වෙරළ තීරය (…….)

29. ඓන්ද්‍රීය පොහොර භාවිතය ප්‍රචලිත කිරීම සඳහා කාබනික පොහොර මධ්‍යස්ථානයක් පිහිටුවා ඇති ප්‍රදේශයක් වන්නේ,
(1) දඹදෙණිය (2) කටුගම්පොල
(3) රාජාංගනය (4) මාකඳුර (…….)

30. ජාත්‍යන්තර වෙළඳාමේ දී යකඩ හා වානේ අපනයනය කරන ඇතැම් රටවල් ඒවා ආනයනය ද සිදු කරයි. එවැනි රටවල් දෙකක් ඇතුළත් වන පිළිතුර වන්නේ,

(1) ඉන්දියාව, තායිලන්තය (2) චීනය, දකුණු කොරියාව
(3) චීනය, ඉන්දියාව (4) රුසියාව, චීනය (…….)

31. පහත A සිට E දක්වා දී ඇති තොරතුරු අතරින් රබර් වගාව සඳහා පමණක් අදාළ වන ප්‍රකාශ ඇතුළත් පිළිතුර තෝරන්න.

A. ලැටරයිට් හෝ කබොක් මිශ්‍ර රතු පස
B. 1900mm සිට 5460mm දක්වා වූ වර්ෂාපතනය
C. වාරි ජල සම්පාදනය
D. $27^0$ C ක පමණ උෂ්ණත්වය
E. ලෝම හා ලැටරයිට් පස

(1) A හා D (2) B හා C (3) C හා D (4) D හා C (…….)

32. වර්ග කිලෝමීටර 16 ක සමචතුරස්‍රාකාර වගා බිමක්, 1:50,000 සිතියමක නිරූපණය කරන විට එහි පැත්තක දිග සෙන්ටිමීටර කීයක් වේ ද ?

(1) 4cm (2) 6 cm (3) 8cm (4) 16cm (…….)

33. ක්ෂය වන සම්පත් පමණක් දැක්වෙන වරණය තෝරන්න

(1) පොසිල ඉන්ධන, පස, වන ජීවීන් (2) වනාන්තර, සරු පස, ජලය
(3) වනාන්තර, මත්ස්‍යයන්, ඛනිජ (4) පොසිල ඉන්ධන, වනාන්තර, සරු පස (…….)

34. පහත A සිට E දක්වා ඇති නිර්ණායක අතරින් **මානුෂ සංවර්ධන දර්ශකයට පමණක්** අදාළ වන නිර්ණායක ඇතුළත් පිළිතුර කුමක් ද ?

A. මරණ අනුපාතය
B. උපතේ දී ආයු අපේක්ෂාව
C. දෛනික කැලරි පරිභෝජනය
D. සාක්ෂරතාව
E. සෞඛ්‍ය පහසුකම්

(1) A හා B (2) B හා D (3) C හා D (4) D හා E (…….)

35. ජලවාෂ්ප, වලාකුළු හා දූවිලි අංශු දක්නට නොලැබෙන ස්තරය වන්නේ,

(1) පරිවර්ති ගෝලය (2) අපරිවර්ති ගෝලය
(3) මෙසෝ ගෝලය (4) තාප ගෝලය (…….)

36. ඉතාලියේ පොම්පෙයි නගරයේ විනාශය කෙරෙහි බලපෑ ගිනි කන්ද වන්නේ,

(1) විසුවියස් (2) එට්නා

(3) ෆුජියාමා (4) හෙක්ලා (…….)

37. ජල ගැලීම් ආපදාව අවම කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ගයක් වන්නේ,

(1) උස ප්‍රදේශවල ජලාශ ඉදි නො කිරීම

(2) වැසි ජලය එක් රැස් කර ගැනීම

(3) ශක්තිමත් සුළං බාධක ඇති කර ගැනීම

(4) ගංගාවල මෝය විවෘත ව තබා ගැනීම (…….)

- **පහත A , B , C හා D වලින් දක්වා ඇති එකිනෙකට සම්බන්ධ මාතෘකා යුගල හොඳින් අධ්‍යයනය කොට අංක 38 සිට 40 දක්වා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A - 1. ආයු අපේක්ෂාව
2. වියපත් සංඛ්‍යාව

B - 1. ඓන්ද්‍රීය පොහොර භාවිතය
2. පාංශු හායනය

C - 1. ගෝලීය උණුසුම
2. ජෛව විවිධත්ව හායනය

D – 1. වියපත් වීම
2. සංක්‍රමණ

38. පළමුවැන්නේ වැඩි වීම දෙවැන්නේ ද වැඩි වීමට හේතු වන මාතෘකා යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D (…….)

39. පළමුවැන්නේ වැඩි වීම දෙවැන්නේ අඩු වීමට හේතු වන මාතෘකා යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D (…….)

40. ප්‍රකාශ අතර කිසිම සම්බන්ධතාවක් නො දක්වන යුගලය කුමක් ද ?

(1) A (2) B (3) C (4) D (…….)

*****